# රින්සායිගේ කියමින් –
# බෞද්ධ විසංයෝජන කලාවට ප්‍රවේශයක්

ජයන්ත බෝගොඩ
බාහිර කථිකාචාර්ය,
භික්ෂු විශ්වවිද්‍යාලය , අනුරාධපුර

**"බෞද්ධ විසංයෝජන කලාව"** යන යෙදුම බොහෝ දෙනෙකුගේ කුකුසට හේතුවනු ඇත. මන්ද " වියෝජනය" ඉතා මෑතකදී භාවිතයට පැමිණි වහරක් බැවිනි. විසංයෝජනය (Deconstruction) බෞද්ධ කතිකාවත් තුළින් ඍජුව ම වහරට එකතු වූ පදයක් නොවීම ද එම කුකුස තවදුරටත් වඩවනු ඇත. එ බැවින් පළමු විසංයෝජනය (Deconstruction) පදෙයෙහි පසුබිම පැහැදිලි කර ගැනීම වඩාත් සුදුසු වනු ඇත.

"මාර්ටින් හෛඩෙගර්" නැමැති බටහිර දාර්ශනිකයා පළමු වරට විසංයෝජනය යන පදයට ආසන්න භාවිතය හඳුන්වා දුන් පුද්ගලයා ය. 1972 ඔහු විසින් රචිත "Being and Being" නැමැති කෘතියෙහි ඔහු විසින් භාවිත කළ "Destruktion" නැමැති ජර්මන් වචනය ප්‍රංශ ජාතික "ජාක් ඩෙරිඩා" (J. Derrida) ඉංග්‍රීසි භාෂාවට පරිවර්තනය කළේ "Deconstruction" (විසංයෝජනය) යනුවෙන් ය. එතැන් පටන් "විසංයෝජනය" පශ්චාත් ව්‍යුහ වාදී හා පශ්චාත් නූතනවාදී කතිකාවක් ලෙසින් භාවිත කෙරේ.

විසංයෝජනය (Deconstruction) යන යෙදුම හඳුන්වා දීමට මුල් වී එය වර්ධනය කළ ඩෙරිඩාට ඒ පිළිබඳ සරල නිර්වචනයක් ඉදිරිපත් කළ නොහැකි විය. කෙසේ වෙතත් ඔහුට හිතකාමී විචාරකයන් විසංයෝජනය හඳුන්වා ඇත්තේ එකිනෙකට ගැටෙන සුළු අයුරින්, පෙනෙන විවිධ "හඬ" (Voices) තුළින් බටහිර බුද්ධිමතුන්ගේ කනට කතා කළ හැකි අයුරින් කෘතියක් තුළ දිස්වෙන පැහැදිලි ව හඳුනාගත නොහැකි අයුරින් කෘතියේ ම ඇති තත්ත්වයක් ලෙස ය. (An Indeterminate Property of Text) ඩෙරිඩාගේ අදහස ප්‍රිය නොකළ විචාරකයන් විසංයෝජනය සාපේක්ෂවාදී හෝ නාස්තික වාදයේම රූපයක් (A form of Relativism or Nihilism)

ලෙසින් හඳුන්වති. ඔවුන්ට අනුව විසංයෝජනය කිසියම් ව්‍යාපෘතියකි. ක්ෂේත්‍රයකි. විසංයෝජනවාදය (Deconstuctionalism) යන ව්‍යවහාරයට ඔවුහු බර වෙති. විසංයෝජනය ග්‍රන්ථ විචාරයේදී යොදා ගන්නා උපාය මාර්ගයකි. කතුවරයාගේ භාෂාව තුළින් මතු කෙරෙන ගැඹුරු තර්කයන්ට වඩා, එම භාෂාවේ ඇතුළත් අධි භෞතික ලක්ෂණ ඉස්මතු කර දැක්වීම විසංයෝජනය මගින් සිදු කෙරේ.

කෙසේ වෙතත් ඩෙරිඩා විසංයෝජනය හා බැඳුණු " වාදය " (Ism) යන්න ප්‍රතික්ෂේප කරයි. විසංයෝජනය ව්‍යාපෘතියක් , ක්ෂේත්‍රයක් හෝ ගුරුකුලයක් ය යන මතයද ප්‍රතික්ෂේප කරයි. ඔහුට අනුව විසංයෝජනය යනු කෘතියක ස්වභාවය තුළ ම නෛසර්ගික ව පිහිටා ඇති යමකි. (Someting inherent in the nature of text itself) ඩෙරිඩා ඇතුළු පශ්චාත් නූතන වාදීන් විසංයෝජනය යොදා ගත්තේ, බටහිර බුද්ධි ප්‍රබෝධය (Enlightment) හා නූතන වාදය (Modernism) හා බැඳුණු අධි භෞතික සංකල්පීය රාමු බිඳ දැමීමට ය. අද වන විට විසංයෝජනය විචාර කලාවක් ලෙස විවිධ විෂය ක්ෂේත්‍රයන් ඔස්සේ පැතිර ගොස් ජනප්‍රිය කලාවක් බවට පත්ව ඇතැයි කිව හැකි ය. ගෘහ නිර්මාණ ශිල්පය, චිත්‍ර කලාව. සාහිත්‍යය, සිනමාව හා වෙනත් නොයෙකුත් සමාජයීය විද්‍යා ක්ෂේත්‍රයන් තුළ විසංයෝජනය විචාරාත්මක උපාය මාර්ගයක් ලෙසින් භාවිත වන අයුරු පැහැදිලි ව දැක ගත හැකි ය. ඉතිහාසය නැවත කියවීම, පුරුෂ මූලික ලෝක දෘෂ්ටිය බිඳ හෙළීම ලිංගිකත්වය පුළුල් කතිකාවකට ලක්කිරීම වැනි පශ්චාත් නූතනවාදී විචාරයන්හිදී විසංයෝජනය බෙහෙවින් ම යොදා ගන්නා ලද විචාරාත්මක උපාය මාර්ගයක් බව පෙනී යනු ඇත. ගැහැණු - පිරිමි ආදී ද්විත්මය ප්‍රතිපක්ෂ සංකල්පයන්හි ධූරාවලිය බිඳ හෙළීමට ඩෙරිඩා විසංයෝජනය යොදා ගත්තේ ය.

ඉහත ඉදිරිපත් කොට ඇත්තේ මහද්වීපික කතිකාවත් (Continantal Discours) තුළින් මතු වූ විසංයෝජනය නම් වූ විචාර කලාවේ පසුබිම පිළිබඳ කෙටි නිරීක්ෂණයකි. මහද්වීපික කතිකාවක් ලෙසින් මතුවූ එවැනි විචාර කලාවක් බෞද්ධ කතිකාවන්ට සම්බන්ධ කිරීමෙහිලා ඇතැමෙකු දෝෂ දකිනු ඇත. එහෙත් බෞද්ධ කතිකාවන්ට ම ආවේණික වූ





විසංයෝජන කලාවන් පැහැදිලි ව හඳුනාගත හැකි ය යන්න අපගේ අදහස වේ. ඩෙරිඩා ඇතුළු පශ්චාත් නූතන වාදීන් විසංයෝජනය භාවිත කරන අරමුණ හා සන්දර්භය අතින් බෞද්ධ විසංයෝජන කලාව එකිනෙකින් පැහැදිලි ව වෙනස්විය හැකි ය. ඒවා අතර පවතින සම විෂම ලක්ෂණ පිළිබඳ තුලනාත්මක නිරීක්ෂණයක් කිරීමට මෙහිදී අවකාශයක් නොමැත්තෙ, අපගේ අරමුණ අනෙකක් වීමයි.

රින්සායි (Rinzai) සෙන් ගුරුවරයෙකි. ක්‍රි. ව. 687 දී මියගිය එතුමා ප්‍රකට සෙන් ඇඳුරෙකු වූ **හුවැං හෝ** ගේ ගෝලයෙකි. සෙන් යනු බුදු දහමට අයත් බෞද්ධ නිකායක් වේ. සාම්ප්‍රදායික බෞද්ධ දර්ශනයෙහි එන කේන්ද්‍රීය සංකල්පය පදනම් කරගත් සෙන් බෞද්ධ නිකාය අද ජපන් බුදුදහමේ ප්‍රමුඛ තැනක් ගෙන ඇත. බෞද්ධයාගේ පරම නිෂ්ඨාව වන **"මෝක්ෂය"** හෙවත් බුද්ධත්වය ලබා ගැනීම සඳහා ක්ෂණික මාර්ග ප්‍රගුණ කිරීම සෙන් බෞද්ධ නිකායේ මූලික අරමුණ වේ. සෙන් බෞද්ධ නිකායේ මූලාරම්භකයා ලෙස සලකනු ලබන්නේ ඉන්දියාවෙන් චීනයට බුදුදහම ගෙන ගිය බෝධි ධර්ම භික්ෂුවයි. සෑම පුද්ගලයෙකු තුළ ම බුද්ධත්වයේ බීජ නිළීන ව පවතින්නේ ය යන මහායාන බෞද්ධ ස්ථාවරයේ සෙන් දහම ගොඩනැගී ඇත. සෑම පුද්ගලයෙකු ම පරමාර්ථ වශයෙන් බුද්ධාංකුරයන් වන බැවින්, බාහිර බුද්ධත්වය සොයා යෑම සෙන් බෞද්ධ නිකායිකයන්ගේ දැඩි දෝෂදර්ශනයට ලක්ව ඇත. තමන්ගේ ම මනස තුළ පිහිටා ඇති "බුද්ධත්වය" පසෙකලා බාහිර බුදුවරයින් සරණ යෑම සහ සම්ප්‍රදායික විමුක්ති මාර්ගයන් මත ආධානග්‍රාහීව එල්බ සිටීම විසංයෝජනය කරන තුරු පුද්ගලයාට මෝක්ෂය කරා ළගාවිය නොහැකි ය යන්න ඔවුන්ගේ ප්‍රධාන ඉගැන්වීමකි. මනාසේ පිරී ඇති නොයෙකුත් ද්විත්වමය ප්‍රතිපක්ෂ සංකල්පයන් හිස්කොට මනසේ ගැඹුරු නිශ්චලතාවයන් තුළින් මතුව එන මෝක්ෂ සුවය අත්පත් කරගන්නා මාර්ගය ඉගැන්වීම සෙන් බෞද්ධ නිකායේ අභිලාෂයයි. මෝක්ෂය ලැබීමට කල්ප ගණනක් පෙරුම් පිරීම වෙනුවට, මේ මොහොතේ පටන් බුද්ධත්වය සාක්ෂාත්කරණය කිරීමට, දිරි දීම සෙන් දහමේ සුවිශේෂිතාවය වේ.

සාම්ප්‍රදායික බෞද්ධ ආකල්ප හා තුලනය කරන විට සෙන් දහම, නූතන වාදයට එරෙහි ව ගොඩනැගුණු පශ්චාත් නූතනවාදය වැනිය. නූතනවාදය තුළ එන පුරුෂ කේන්ද්‍රීය දෘෂ්ටිවාදය , පශ්චාත් නූතන වාදය මගින් විසංයෝජනය කෙරෙන පරිද්දෙන් ම සෙන් දහම වැනි මහායාන බෞද්ධ කතිකාවත් මගින් සාම්ප්‍රදායික බෞද්ධ කතිකාවත් විසංයෝජනය කෙරේ.

සෙන් ඇඳුරුවරයෙකු වූ **රින්සායිගේ** කියමන් තුළ ද සාම්ප්‍රදායික බෞද්ධ මනස තුළ මුල් බැස ඇති ආකල්ප විසංයෝජනය කෙරෙන අයුරු දැකිය හැකි ය. බෞද්ධ විසංයෝජන කලාවේ ආරම්භකයා ගෞතම බුදුන් වහන්සේ ය. රජ පවුලක ඉපිද, පසුව අභිනිෂ්ක්‍රමණය කොට බුද්ධත්වය ලැබීමෙන් පසු උන්වහන්සේ පැවති සාම්ප්‍රදායික පුරුෂ කේන්ද්‍රීය දෘෂ්ටිවාදය විසංයෝජනය කළහ. පැවති සාම්ප්‍රදායික ආගමික මත පදනම්ව තිබූ සමාජ සංස්කෘතික රූපය මුළුමනින් ම කඩා බිඳ දමමින් නව සමාජ සංස්කෘතියක් , රූපයක් ගොඩනගන්නට උන් වහන්සේ තම විචාරය යොදා ගත්හ. මූල මාධ්‍යමික කාරිකාව රචනා කළ ආචාර්ය නාගර්ජුන පාදයෝ ද විසංයෝජනවාදියෙකි. සසර සහ නිවන පිළිබඳ ව සාම්ප්‍රදායික ආකල්ප සුණු විසුණු කරමින් සසර හා නිවන එකක් ම වේ යැයි නාගර්ජුන පාදයෝ පෙන්වා දුන්හ. " **විමලකීර්ති නිර්දේශ සූත්‍රය**" වැනි මහායාන සූත්‍ර තුළ ද විසංයෝජන විචාර කලාව පැහැදිලිව දැකිය හැකි ය. ද්විත්වමය චින්තනය සාවද්‍යතාවය විසංයෝජනය කරමින් ගිහි ජීවිතය තුළ ම ඇති මෝක්ෂය හා ස්ත්‍රී බුද්ධත්වය වැනි සාම්ප්‍රදායික බෞද්ධ ආකල්ප වලට සපුරා පටහැනි ලෙස පෙනෙන කතිකාවක් එම සූත්‍රයෙන් ඉදිරිපත් කොට තිබේ.

**රින්සායිගේ** කියමන් බිහිවන්නේ මෙවන් බෞද්ධ විචාර කලාවක් තුළ ය. රින්සායිගේ කියමන් මතුපිටින් ගෙන බලන විට සාම්ප්‍රදායික බෞද්ධ මනස තුළ දැඩි පිළිකුලක් හා වෛරයක් ඇතිකරවන සුළු ය. එහෙත් මුල් බුදුසමයෙහි එන දහම මැනවින් ප්‍රත්‍යක්ෂ කළ අයෙකුට රින්සායි කියමන් පිළිබඳ එබඳු තත්ත්වයක් උදානොවනු ඇත යන්න අපගේ අදහස වේ.





තමාගේ මනසින් බාහිර ව ගොඩනගාගත් සංකල්පීය බුද්ධ ප්‍රතිමාව බිඳ හෙළීමට, රින්සායි දරුණු කුළු පහර එල්ල කළේය. එහෙත් එතුමා බුදුන් මරා දමන්නේ පාපතර , නිසා නොවන බවනම් පැහැදිලිය. රින්සායිගේ කියමන් සිංහලයට පරිවර්තනය කළ ගුණපාල ධර්මසිරි හා මහැඳුරුතුමන්ලාගේ "සත්‍යාවබෝධයට ක්ෂණික මඟ " නැමැති කෘතියෙන් උපුටාගත් රින්සායි කියමන් කිහිපයක් ඇසුරින් අපගේ නිරීක්ෂණය ඇරඹේ.

**"ඔබට බුදුකෙනෙකු මුණගැසුනොත් කපා දමන්න. ඔබට රහතන් වහන්සේ කෙනෙකු මුණ ගැසුනොත් කපා දමන්න. ඔබේ දෙමව්පියන් , ඔවුන් කපා දමන්න. ඔබේ ඥාතීන් , ඔවුන් කපා දමන්න."**

රින්සායිගේ වදන් කුළු පහර කොතරම් සාහසික ද යන්න කෙනෙකුට විශ්වාස කළ නොහැකි තරම්ය. රින්සායි බුදුන් වහන්සේ කපා දමන්න යැයි කීමට තරම් මිථ්‍යා දෘෂ්ටිකයෙකු වීද? නැති නම් මෝඩ තකතීරුවෙකු වීද? මේ ප්‍රශ්නයට පිළිතුරු රින්සායිගේ ඇඳුරුතුමා වූ **හුවැං පෝ** ගේ සෙන් ඉගැන්වීම් ඇසුරින් ඉදිරිපත් වී ඇත්තේ මෙසේය.

**"මේ අවස්ථාවේ දී බුදුන් වහන්සේ කපා දමන්නැයි මා විසින් කරන ලද නිර්දේශය අගෞරව සහිත වූවක් යැයි කීමෙන් ප්‍රවේශම් වන්න. එසේ නැතිනම් මා විසින් බුදුන් වහන්සේ හිරු එළියට උපමා කිරීමෙන් කරන ලද්දේ උතුම් දෙයකැයි කීමෙන් ද ප්‍රවේශම් වන්න. මෙහිදී මා විසින් අන්ත දෙකක් අතර එහා මෙහා වැනෙමින් සිටින ලද්දක් වැනිය."**

හුවැං පෝ ගුරුතුමා තම සිසුන්ට මෙසේ ද අවවාද කළේ ය.

**"ඔබේ එකම ක්‍රියාව විය යුත්තේ කිසිවක එල්බ නොසිටීමයි."**

වරක් බුදුන්වහන්සේගේ රූපශ්‍රියට වශීකෘතව උන්වහන්සේගේ රූපකාය මත එල්බ සිටි භික්ෂුවකට උන්වහන්සේ දේශනා කළේ
**"යො ධම්මං පස්සති. සො මං පස්සති"** යනුවෙන් ය. යමෙක් මාගේ ධර්මය (ධර්මකාය) දකී ද හේ මා (රූපකාය) දකී යනුවෙනි. බුදු වරයෙකුගේ ධර්මය දැකිය හැක්කේ එකී ධර්ම මාර්ගයට ප්‍රවිශ්ට වීමෙනි. ධර්ම මාර්ගයට

ප්‍රවිශ්ට ව ධර්මය දැරිය යුත්තේ ද සීමිත දුරකට ය. ධර්මය ඇසුරු කළ යුත්තේ එය කර පින්නාගෙන යාම සඳහා නොව ගඟින් එතෙර වීම සඳහාම යොදාගන්නා පහුරක් ලෙසට ය. **(කුල්ලූපමං වො භික්ඛවේ ධම්මං දෙසිස්සාමි, නිත්ථරනත්ථාය නො ගහනත්ථාය** - මජ්ඣිම නිකාය) එහෙත් යමෙක් බුදුන් වහන්සේ ගැළවුම්කාර දෙවියෙකු ලෙස ගෙන, ඒ වටා යම් අධිභෞතික සංකල්පීය රාමුවක් ගොඩනඟන්නේ නම් ඉන් සිදු වන්නේ, සැබෑ බුද්ධත්වය යටපත්ව යාම ය. භාෂාවේ වචන ග්‍රහණය කරමින්, සාවද්‍ය වූ පරිකල්පනයේ යෙදෙමින් සංකල්පීය ලෝක ගොඩනැගීම අනුමත නොකර රින්සායිට අවශ්‍ය වී ඇත්තේ එම සංකල්පීය ලෝකයන්හි බිත්ති පුපුරවා හැරීමට ය. මජ්ඣිම නිකායේ මූල පරියාය සූත්‍රය ඊට නිදසුන්ය. මඤ්ඤනාවේ නොයෙදෙන ලෙස භික්ෂූන්ට අවවාද කරන උන්වහන්සේ "නිවන" "නිවන" යැයි නිවන පිළිබඳ කරන මඤ්ඤනාවද නොකළ යුතු යැයි භික්ෂූන්ට උපදෙස් දුන්හ. එහෙත් එම දේශනාව අවසානයෙහි එය ශ්‍රවණය කල භික්ෂු පිරිස එය තේරුම් නොගත් බව දැක්වේ. **(ඉදමවොච භගවා න තෙ භික්ඛු භගවතො භාසිතං අභිනන්දුන්ති)** එච්. එම්. මොරටුවගම මහැදුරුතුමා මූලපරියාය සූත්‍රය මහායානයේ ප්‍රඥා පාරමිතා සූත්‍රයන්ට සමාන කර දක්වා ඇති බව එතුමාගේ **වජ්‍රච්ඡේදිකා** ප්‍රඥා පාරමිතා පරිවතනයේ දී හමු වේ. අනෙක් සෑම සූත්‍ර දේශනාවක්ම අවසානයේ සතුටු වන භික්ෂු පිරිස මූලපරියාය සූත්‍රය ශ්‍රවණය කොට අසතුටු වූයේ ඇයි ද යන්න ද අපගේ විමර්ශනයට හසුවිය යුතු කරුණකි.

බෞද්ධයාගේ පරම සංකල්පය බුද්ධත්වයයි. එකී පරම සංකල්පය අශූචි වැනි යැයි යමෙක් කියන්නේ නම් ඔහු කවර නම් බෞද්ධයෙක්ද?

**"බුද්ධත්වය ලැබීම සඳහා ඔබතුළ තිබෙන බලාපොරොත්තුව ඔබගේ කරපිට යෙදූ වියගසක් වැනිය. බුද්ධත්වය යනු වැසිකිලියෙහි ඇති අසූචිය."**

බුද්ධත්වය හා අශූචි අතර වෙනසක් නොදකින රින්සායි නිවැරදිද? "බුද්ධත්වය " උතුම් පවිත්‍ර ලෙසත් අශූචි පහත් අපවිත්‍ර ලෙස යමෙකුට හැඟේ නම් ඔහු ද්විත්වමය ප්‍රතිපක්ෂ සංකල්ප මත ගොඩනැගුණු ලෝකයක සිරවූවකි. ඔහු ද්විත්වමය චින්තනයේ සාවද්‍යතාව නොදුටු අයෙකි. ඔහු වචන හා අක්ෂර ග්‍රහණය කළ අයෙකි. ඔහු මනස හිස් කළ අයෙකු නොව





මනස විවිධ වූ සංකල්පයන්ගෙන් පුරවාගත් අයෙකි. ද්විත්වමය චින්තනයේ උපකාරයෙන් තනාගන්නා සංකල්පීය ලෝකය විසංයෝජනය කිරීම රින්සායිගේ අරමුණ බව පැහැදිලි ය. ජාක් ඩෙරීඩා ද ද්විත්වමය ප්‍රතිපක්ෂ සංකල්පයන් විසංයෝජනය කළේ ය. එහෙත් ඩෙරීඩා මුළුමනින් ම ද්විත්වමය ප්‍රතිපක්ෂ සංකල්පයන් විසංයෝජනය කළේ නැත. දෙවියන් - මිනිසා වැනි ද්විත්වමය ප්‍රතිපක්ෂ සංකල්පයන්ගේ සිරස් ධූරාවලිය විසංයෝජනය කළ ඩෙරීඩා එම සංකල්පයන් තිරස්ව ප්‍රතිෂ්ඨාපනය කළේ ය. එහෙත් බෞද්ධ විසංයෝජනයෙන් සියළුම ආකාරයේ ද්විත්වමය චින්තනය බැහැර කෙරෙයි.

මජ්ඣිම නිකායේ අලගද්දූපම සූත්‍රයට අනුව ධර්ම අධර්ම සියල්ලම අවසානයේදී අත්හළ යුතු ය.

**"සබ්බේ ධම්මා පහාතබ්බා, පගෙ වා අධම්මා"**

රින්සායි මේ කියන්නේ එයම නොවේද?

**"ඔබ සොයන්නේ කුමක්ද? ඉතාමත්ම උසස් ඉගැන්වීම් ඇතුළත් ග්‍රන්ථ පවා කුණු කූඩයට දැමීමට සුදුසු කොළ පමණි. ඒවා සුදුසු වන්නේද අශූචි තැවරුණු තැනක් පිසදැමීම සඳහා පමණය."**

**"කුල්ලූපමං වො භික්ඛවේ ධම්මං දෙසිස්සාමි........."** යන බුදු ඔවදනට අනුව රින්සායි නිර්දෝශීය.

**"පූජනීය දේව හෝ සාමාන්‍ය යන මේ දෙකටම ඇල්මක් නොදක්වන්න."**

රින්සායිගේ කියමන් මඟින් හෙළි කරන්නට උත්සාහ දැරෙන යථාර්ථය නම් භාෂාතික්‍රාන්තය. භාෂාවේ ප්‍රයෝගකාරී භාවිතයන්ට හා ඉන්ද්‍රිය සංවේදිත ඥානයට මනස මුලා කිරීමට ඉඩ නොතබා, සියලු සාවද්‍ය සංකල්පයන්ගෙන් වියුක්ත වූ පරම නිශ්චලතාවය හෙවත් ශූන්‍යත්වයට මනස පත් කිරීම රින්සායිගේ ඉගැන්වීම් වේ. ඇඟිල්ල දිගු කොට සඳ පෙන්වන කළ සඳ දෙස නොව ඇඟිල්ල දෙසම බලා සිටින බාලයෙකු

ලෙස, රින්සායිගේ වචනවල එල්බ ගැනීමෙන් එතුමා පෙන්වන්නට උත්සාහ දරන දේ දැකිය නොහැකි වේ.

**"නොරැවටෙන්න, පිටතින් හෝ ඇතුළතින් සොයා ගැනීමට නිසිවක් ඇත්තේ නැත. එමෙන්ම මගේ වචනවල එල්ලීගෙන නොසිටින්න. ශාන්තව, ශූන්‍ය වූ මනසකින් යුතුව ඔබේ ගමන යන්න. අඳින ඇඳුම් අඳිමින්, කෑමට තිබෙන බත් ටික බුදිමින්, නිසංසලව සාමාන්‍ය ආකාරයට ජීවත්වීම හොඳටම සෑහේ."**

රින්සායිගේ කියමන්වලින් ප්‍රකට වන බෞද්ධ විසංයෝජනයේ යම් නිෂ්ඨාවක් ඇත. එනම් සත්ත්වයාට මෝක්ෂය උදා කර දීමට උපකාර කිරීමයි. එහෙත් ඩෙරීඩා වැනි පශ්චාද් නූතනවාදීන් විසංයෝජනය තුළින් ගොඩනගන කතිකාවත්හි නිෂ්ඨාව කුමක්ද?

ඔවුන්ට එවැනි පැහැදිලි නිෂ්ඨාවක් නැත යන්න ඇතැම් විචාරකයන්ගේ මතයයි. එබැවින් පශ්චාද් නූතනවාදය හුදු සාපේක්ෂවාදයක් නැතිනම් නාස්තිකවාදයක් මිස ඉන් සමාජගත දුකට පිළියමක් නැතැයි සමහර විචාරකයන් පෙන්වා දී ඇත.

බෞද්ධ විසංයෝජන කලාවේ අවසාන ඉලක්කය **හුවැං පෝ** ගේ සෙන් ඉගැන්වීමකින් මෙසේ විස්තර කෙරෙයි.

**"අතීතය වර්තමානය සහ අනාගතය යන වචන සිතීමේ වරදට අසුවීමෙන් වළකින්න. අතීතය පසු වී නැත. වර්තමානය ක්ෂණයකින් නැතිවන මොහොතකි. අනාගතය යනු ඉදිරියේදී පැමිණීමට තිබෙන දෙයක් නොවේ. ඔබ චිත්ත දමනය ප්‍රගුණ කරන විට සම්පූර්ණ නිශ්චල භාවයකින් සිටින්න. ඔබගේ සිත තුළ ඇතිවන ඉතාම ඉතාමක් කුඩා චංචලතාවයකට වුවද ඔබට කරදර කිරීමට ඉඩ නොතබන්න. මෝක්ෂය යන්නෙන් අදහස් කරන්නේ මෙපමණය."**





## ආශ්‍රිත ග්‍රන්ථ


1. **සත්‍යාවබෝධයට ක්ෂණික මඟ** - ගුණපාල ධර්මසිරි, ඩබ්. එම්. ගුණතිලක, ආර්ය මුද්‍රණය, මහනුවර. 1989

2. **හුවැං පෝ ගේ සෙන් ඉගැන්වීම්** - ගුණපාල ධර්මසිරි, ඩබ්. එම්. ගුණතිලක, පියසිරි ප්‍රින්ටින් සිස්ටම්ස් නුගේගොඩ.

3. **වජ්‍රඡේදිකා ප්‍රඥා පාරමිතා** - එච්. එම්. මොරටුවගම, එස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ 10 - 1992

4. http : // en, wiki. pedia. orgl / wiki / Deconstruction


06 OCT 2005